**රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව - 2020**

**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

----------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

--------------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම
  ප්‍රබලවන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරනලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරනලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයනලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) පනතේ 6(1)(ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) පනතේ 6(1)(ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

---------------------------------------------------------------------------

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුද්දර ගාස්තු ඇස්තමේන්තුගත ආදායම සමාලෝචිත වර්ෂයේ ආදායම ලෙස ගිණුම්ගත කරනු වෙනුවට උපලේඛන වලින් තහවුරු වූ මාස කිහිපයක මුද්දර ගාස්තු වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කිරීමෙන් මුද්දර ගාස්තු ආදායම හා ලැබිය යුතු මුද්දර ගාස්තු රු. 4,690,578 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි වර්ෂයේදී මෙය නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුයි |
| (ආ) | ආදායම් විෂයයන් 06 ක ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශේෂය රු. 10,653,851 ක් වුවද සමාලෝචිත වර්ෂය ආරම්භයේදී එම ශේෂය රු. 1,747,441 කින් අඩුවෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුම සකස් කිරීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතුයි. |
| (ඇ) | 2020 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන ලෙජරයේ සේවක ණය ගිණුමේ හර ශේෂය රු. 850,918 කින් අඩු වීමට හේතු සොයා නිවැරදි කිරීමට කටයුතු නොකර ''ශේෂයට ගැලපීම'' ලෙස තනි සටහනක් දක්වා ගිණුම තුලනය කර තිබුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුම සකස් කිරීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතුයි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී රු. 756,395 ක් වටිනාකමැති ගබඩා ශේෂයන් 03 ක ආරම්භක හා අවසාන ශේෂ අතර වෙනස සමුච්චිත අරමුදලට ගලපනවා වෙනුවට ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායකවීමේ ගිණුමට මාරු කර තිබුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුම සකස් කිරීමේ දී මෙය නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතුයි. |
| (ඉ) | වෙන්දේසි කළ යුතු ලෙස නිර්දේශ කරන ලද රු. 3,032 ක් වටිනාකමැති තොග සහ රු. 567,989 ක් වටිනා ස්ථාවර වත්කම් වෙන්දේසි කිරීමට පෙර සමාලෝචිත වර්ෂයේදී පොදු ගබඩා තොග වලින් හා ස්ථාවර වත්කම් ගිණුමෙන් ඉවත් කර තිබුණු අතර ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායකවීමේ ගිණුමටද ගලපා තිබුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුම සකස් කිරීමේ දී මෙය නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | වෙන්දේසි කරන තුරු වත්කම්වල වටිනාකම ගිණුම්වලින් ඉවත් නොකල යුතුයි. |
| (ඊ) | ලැබියයුතු කර්මාන්ත ආධාර ණයගැති ගිණුමේ රු.382,136 ක වෙනස සමුච්චිත අරමුදලට ගැලපීම වෙනුවට ආරම්භයේ පැවති සම්පූර්ණ ශේෂයම සමුච්චිත අරමුදලට ගලපා තිබුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුම සකස් කිරීමේ දී මෙය නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතුයි. |
| (උ) | සමාලෝචිත වර්ෂයට අදාලව ලැබිය යුතු උසාවි දඩ මුදල රු. 6,102,505 ක් වුවද එය රු. 5,769,505 ක් ලෙස ගිණුම්ගත කිරීමෙන් වර්ෂයේ උසාවි දඩ ආදායම හා ලැබිය යුතු උසාවි දඩ ආදායම රු. 333,000 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුම සකස් කිරීමේ දී මෙය නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතුයි. |
| (ඌ) | සමාලෝචිත වර්ෂයට අදාල ස්ථාවර තැන්පතු පොළී ආදායම රු. 252,640 ක් හා ලැබිය යුතු පොළී ආදායම රු. 231,663 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුම සකස් කිරීමේදී මෙය නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතුයි. |
| (එ) | සමාලෝචිත වර්ෂයේදී මහජන නියෝජිතයන් සඳහා ලබා දෙන ලද රු. 780,000 ක ණය අත්තිකාරම් පොදු පරිපාලන දීමනා ලෙස ගිණුම්ගතකිරීමත් එම මුදලින් ආපසු ලැබූ රු. 600,000 ක මුදල වැටුප් ප්‍රතිපූර්ණ ලෙස ගිණුම්ගත කිරීමත් හේතුවෙන් තව දුරටත් ලැබිය යුතු රු. 180,000 ක මුදල ජංගම වත්කම් යටතේ දක්වා නොතිබුණු අතර මෙහෙයුම් අතිරික්තයද ඒ හා සමාන ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුම සකස් කිරීමේදී මෙය නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතුයි. |

| | | | |
|---|---|---|---|
| (ඒ) | සමාලෝචිත වර්ෂයේදී මිලදීගෙන තිබූ රු. 104,800 ක් වූ ලී බඩු හා සවිකිරීම් විවිධ වියදම් යටතේ ගිණුම්ගත කිරීම හේතුවෙන් ලී බඩු හා සවිකිරීම් හා වර්ෂයේ මෙහෙයුම් අතිරික්තය ඒ හා සමාන ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුම සකස් කිරීමේ දී මෙය නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | අයභාර සහ ප්‍රාග්ධන වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීම සිදුකල යුතුය. |
| (ඔ) | ඉකුත් වර්ෂයේ දෙසැම්බර් මාසය සඳහා ලැබිය යුතු වැටුප් ප්‍රතිපූර්ණ මුදල රු. 51,119 කින් වැඩියෙන් සටහන් වීම නිවැරදි කිරීමට ලැබිය යුතු වැටුප් ප්‍රතිපූර්ණ ගිණුම බැර කිරීම වෙනුවට හර කිරීම හේතුවෙන් 2020 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ශේෂය රු. 102,238 කින් වැඩියෙන් දක්වා තිබුණි. | 2019 නොවැම්බර් ලැබිය යුතු වැටුප් ප්‍රතිපූර්ණ ලෙස දක්වා තිබූ මුදලත්, දෙසැම්බර් මස සත්‍ය ලෙස ගෙවා ඇති මුදලත් අතර වෙනස ලැබිය යුතු වැටුප් ප්‍රතිපූර්ණ ලෙස වැඩිපුර දක්වා තිබූ මුදල බව දන්වා තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතුයි. |
| (ඕ) | සමාලෝචිත වර්ෂයේ ඉඩම් හා ගොඩනැගිලි උපලේඛණයේ දක්වා තිබුණු ඉඩම් 60 ක වටිනාකමද, සභාව සතු රුවන්වැල්ල සති පොල හා හලර් යන්ත්‍රයේ වටිනාකමද, කොම්පෝස්ට් ව්‍යාපෘතිය යටතේ නිෂ්පාදනය කරනු ලබන පොහොර තොගයද හඳුනාගෙන ගිණුම්ගතකර නොතිබුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුම සකස් කිරීමේ දී මෙය නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | පිරිවැය හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතුයි. |
| (ක) | සමාලෝචිත වර්ෂය අවසානයට ජංගම නොවන වත්කම්වල වටිනාකම රු.274,982,336 ක් වුවද එදිනට ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායකවීමේ ගිණුමේ ශේෂය රු. 275,674,705 ක් වූයෙන් එම ගිණුම් දෙක අතර රු. 692,369 ක වෙනසක් පැවතුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුම සකස් කිරීමේ දී මෙය නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කළ යුතුයි. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 08 කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. 345,475,284 ක් හා උපලේඛන අනුව වටිනාකම රු. 340,900,197ක් වූයෙන් රු.4,575,087 ක වෙනසක් විය | 2021 වර්ෂයේ නිවැරදි කිරීමට කටයුතු කරන බවත්, ආදායම් විෂයයන් වල වෙනස ලෙස දැක්වෙන්නේ ඉදිරි වර්ෂය සඳහා සමාලෝචිත වර්ෂයේ ලැබීම් හා සමාලෝචිත වර්ෂයට අදාල පෙර වර්ෂයේ ලැබීම් අතර වෙනස බවත් දන්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂයන් ඊට අදාල උපයෝගී ලේඛන සමග සැසඳිය යුතුයි. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු. 40,709,453 ක් වූ ගිණුම් විෂයයන් 03 කට අදාලව විගණනයට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුම සකස් කිරීමේ දී මෙය නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | ගිණුම් ශේෂ තහවුරු කරගැනීම සඳහා ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි. |

## 1.7 අනුකූල නොවීම්

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 වගන්තිය හා සබරගමුව පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛ අංක 2005/04 හා 2005 ජූනි 01 දිනැති චක්‍රලේඛයේ 3(iv) හා 3(x) වගන්ති | ඉඩම් ලියා පදිංචි කිරීමේ කාර්යාලයෙන් විස්තර ලබාගෙන කට්ටිකර විකුණන ඉඩම්වල විකුණුම් වටිනාකමින් සියයට එකක බදු මුදලක් සභාවට අයකරගතයුතු වුවත් කට්ටි කරන ලද ඉඩම්වලින් තක්සේරු වටිනාකම මත පමණක් 2010 වර්ෂයේ සිට<br><br>සමාලෝචිත වර්ෂය දක්වා බදු රු.1,121,730 ක් අයකරගෙන තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව ඉදිරියේදී කටයුතු කරන බව දන්වා තිබුණි. | පනත හා චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුයි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 571(3) | 2018 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ලැබී තිබුණු ආපසු නොගෙවන රු. 637,537ක තැන්පතු, අදාල වර්ෂවලදී ආදායමට නොගෙන තැන්පතු ලෙස රඳවාගෙන තිබුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුම සකස් කිරීමට පෙර මෙය නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුයි. |
| (ඇ) | 2002 අංක 14 දරන එකතුකළ අගය මත බදු පනතේ 41 (1) වගන්තිය | සභාව වෙත 2019 සැප්තැම්බර් 16 දින නිවේදනය කර තිබූ පැහැර හරින ලද බදු මුදල හා ඊට අදාල දණ්ඩනයෙහි එකතුව රු. 627,863 ක් වූ නමුත් ගිණුම අනුව ගෙවිය යුතු බදු මුදල රු. 427,843 | තොරතුරු තහවුරු කර ගැනීම සඳහා ගොනුවක් සොයා ගැනීමට නොහැකි බැවින් වෙනත් ලේඛන පරීක්ෂා කරමින් | ගෙවිය යුතු නිවැරදි බදු මුදල හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කල යුතුයි. |

| | | | | |
|---|---|---|---|---|
| | | ක් ලෙස හඳුනාගෙන තිබූ අතර විගණිත දින දක්වා එය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. එමෙන් එම කාල සීමාවට අදාල එකතුකළ අගය මත බදු වාර්තාද විගණනයට ඉදිරිපත් නොවීය. | කටයුතු කරන අතර 2021 වර්ෂයේ අවසන් ගිණුම සකස් කිරීමේ දී මෙය නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. . | |
| (ඇ) | 2009 අංක 09 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනතේ 06 වන වගන්තිය | 2019 සැප්තැම්බර් 30 දින කර තිබූ නිවේදනය අනුව පැහැර හරින ලද බදු මුදල හා ඊට අදාල දණ්ඩනය රු. 77,340 ක් විය. නමුත් අවසන් ගිණුම අනුව පිළිවෙලින් ගෙවිය යුතු හා පෙර ගෙවුම් ලෙස රු. 257,646 ක් හා රු. 218,840 ක් දක්වා තිබුණි. මෙම ශේෂ නිරවුල් කිරීමට විගණිත දින වන විටත් කටයුතු කර නොතිබූ අතර එම කාලසීමාවට අදාල ජාතිය ගොඩනැගීමේ බදු වාර්තාද ඉදිරිපත් නොවීය. | තොරතුරු තහවුරු කර ගැනීම සඳහා ගොනුවක් සොයා ගැනීමට නොහැකි බැවින් වෙනත් ලේඛන පරීක්ෂා කරමින් කටයුතු කරන අතර 2021 වර්ෂයේ අවසන් ගිණුම සකස් කිරීමේ දී මෙය නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. . | ගෙවිය යුතු නිවැරදි බදු මුදල හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කල යුතුයි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.6,709,574 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.7,519,782 ක් විය

**2.2 ආදායම් පරිපාලනය**

ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් හා බදු | | |
| (i) | සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ වරිපනම් බදු ශේෂය රු. 3,992,934 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | තව දුරටත් දේපල 85 ක හිඟ මුදල් කපා හැරීම සඳහා පළාත් පාලන කොමසාරිස් කාර්යාලය වෙත යොමුකර ඇති බවත් දේපල 80 ක් ඉවත්වූ දේපල ලෙස නම්කර ඇතත් එම දේපල වල හිඟ කපාහැරීමට මහා සභාවේ අනුමැතිය ලබාගෙන නොපමාව ඉදිරි කටයුතු සිදුකරන බවත් දන්වා තිබුණි. | පනත ප්‍රකාරව කටයුතුකර හිඟ ශේෂ අයකරගත යුතුයි. |

| | | | |
|---|---|---|---|
| (ii) | සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ අක්කර බදු ශේෂය රු. 91,394 ක් විය. | ඉදිරියේදී හිඟ අයකරගැනීම සඳහා කටයුතු කරන බව දන්වා තිබුණි. | හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතුකල යුතුයි. |

(ආ) කුලී

-----

| | | | |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය අවසානයට සතිපොල, මාළුකඩ හා මස්කඩ කුලී හිඟ ශේෂය රු. 1,618,903ක් අයකර නොතිබුණි. | එක් ස්ථානයක් වෙනුවෙන් නීතිමය වශයෙන් කටයුතු කර ඇති බවත්, ඉතිරි මස්කඩ හිඟ අයකර ගැනීම සම්බන්ධයෙන් කටයුතු කරගෙන යන බවත් දන්වා තිබුණි. | හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කල යුතුයි. |
| (ii) | සමාලෝචිත වර්ෂය අවසානයට පොදු වෙළඳපල හා පොදු වෙළඳපල නොවන කඩ කාමර කුලී හිඟ ශේෂය රු. 4,461,797 ක් හා හිඟ දඩ මුදල් ශේෂය රු. 763,801 ක් විය. | අයකිරීම අවම මට්ටමක පැවතීමට ප්‍රධානතම හේතුව කොවිඩ් වසංගත තත්වය බවත් මේ වන විට හිඟ අයකරගැනීම සඳහා ආදායම් පරීක්ෂක මහතුන් වෙත දන්වා ඇති අතර, හිඟ ගෙවන ලෙස බදුකරුවන්ටද ලිඛිතව දැනුම් දී ඇති බවත් දන්වා තිබුණි. | හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කල යුතුයි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 මතභේදයට තුඩු දෙන ගනුදෙනු

-------------------------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් පාලන කොමසාරිස්ගේ අංක 2009/01 හා 2009 දෙසැම්බර් 22 දිනැති චක්‍රලේඛයේ 2 වගන්තිය අනුව සභාපතිවරයාට සංයුක්ත දීමනාව ගෙවිය හැකි වන්නේ අදාල පළාත් පාලන බල ප්‍රදේශයෙන් පිටත රාජකාරී ගමන් සඳහා පමණක් වුවද ඊට පටහැනිව 2020 ජනවාරි සිට මාර්තු දක්වා දිනකට රු. 1,000 බැගින් මාසයේ සියලු දිනයන් ඇතුලත් වන පරිදි රු. 87,000 ක මුදලක් ගෙවා තිබුණි. | ධාවන සටහන් ලිවීමේ ගැටළුවක් මත මෙය සිදුව ඇති බවත්, විගණනයෙන් පෙන්වාදීමෙන් පසු රියදුරන් වෙත හා අනිකුත් නිලධාරීන් වෙත උපදෙස් ලබාදී මෙය නිවැරදි කර ඇති බවත් දන්වා තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුයි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සභාව සතු කැබ් රථයක මයිලෝ මීටරය හා දෛනික ධාවන සටහන්හි සඳහන් කිලෝ මීටර් ගණන අතර කිලෝ මීටර් 17,554 ක වෙනසක් පැවතුණෙන් රු. 260,728 ක් වටිනා ඉන්ධන ලීටර් 2,507 ක් වැඩියෙන් ලබා ගෙන තිබුණි. | මෙම වෙනස සම්බන්ධයෙන් එවකට රථයේ රියදුරු වෙත කරුණු ඉදිරිපත්කරන ලෙසට දන්වා ඇතත් මේ දක්වා කරුණු ඉදිරිපත්කර නොමැති බවත් නොපමාව ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බවත් දන්වා තිබුණි. | අක්‍රමිකතාවයක් සිදුවී ඇත්දැයි පරීක්ෂා කල යුතුයි. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

-------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තනතුරු 13 ක පුරප්පාඩු 28 ක් වූ අතර, තනතුරු 06 ක අතිරික්ත සේවක සංඛ්‍යාව 24 ක් විය. ප්‍රාදේශීය සභාවේ මෙහෙයුම් ක්‍රියාකාරීත්වයට සෘජුවම බලපාන ලේකම් තනතුර 2011 මාර්තු 31 දින සිටද, පුස්තකාලයාධිපති තනතුරු 02 ක් , සණ අපද්‍රව්‍ය මධ්‍යස්ථාන භාරකරු තනතුර හා වැඩ ක්ෂේත්‍ර අධීක්ෂක තනතුර 2013 ජනවාරි 21 සිටද, සැලසුම් ශිල්පී තනතුර 2015 සැප්තැම්බර් 23 සිටද පුරප්පාඩුව පැවතුණි. පුරප්පාඩු සම්පූර්ණ කිරීමටද, අතිරික්ත කාර්යමණ්ඩලය අනුමත කරවා ගැනීමට හෝ කාර්යමණ්ඩලය සංශෝධනය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කාර්ය මණ්ඩල හිඟය හේතුවෙන් රාජකාරි කටයුතු සඳහා බාධා පැමිණෙන බැවින් තනතුරු ඇතිකර ගැනීමට යොමුකර ඇති බවත්, අනියම් පදනම යටතේ බඳවාගත් කාර්ය මණ්ඩලය ස්ථිර කර දෙන ලෙස ඉල්ලා සිටීමට සභා සම්මත කර ඇති බවත් ඒ අනුව ඉදිරි කටයුතු සිදුකිරීමට නියමිත බවත් දන්වා තිබුණි. | පුරප්පාඩු සම්පූර්ණ කරගැනීමටත්, අතිරික්ත කාර්ය මණ්ඩලය අනුමෑ කරවා ගැනීමට හෝ කාර්ය මණ්ඩලය සංශෝධනය කරගැනීමටත් කටයුතු කල යුතුයි. |

## 4. ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

----------------------------------

පාරිසරික ගැටළු

---------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව වාර්ෂිකව එකතුවන ටොන් 365 ක් පමණ වන කසල වලින් කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය සිදුකර තිබුණු නමුත් කසල අංගනය තුල නිෂ්පාදනය කර ඉතිරිවන නොදිරන ද්‍රව්‍ය බැහැර කිරීම සඳහා ස්ථානයක් නොතිබීම හේතුවෙන් රු.300,000ක වාර්ෂික කුලියට ලබාගත් පෞද්ගලික ඉඩමකට බැහැර කිරීමට සිදුවී තිබුණි. | සනීපාරක්ෂක බිම් පිරවුමක් සඳහා ඉඩමක් පවරාගෙන ඇති බවත්, ඒ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු මධ්‍යම පරිසර අධිකාරිය වෙතින් මේ වන විට සිදුකරමින් පවතින බවත්, දන්වා තිබුණි. | ඉතිරිවන නොදිරන ද්‍රව්‍ය බැහැර කිරීම සඳහා ස්ථානයක් සපයාගත යුතුයි. |